# 20 අනලස් ව වැඩ කරමු ජීවිතය ගොඩ නගමු

ඈත අතීතයේ රජගහ නුවර '**අහිවාතක**' නම් සුව කළ නො හැකි භයානක රෝගයක් පැතිරිණි. මෙම රෝගය වැළඳුණු සියල්ලෝ ම මරුමුවට පත් වූහ. "රෝගය නො වැළඳී ජීවිතය ගලවා ගැනීමට නම්, නිවසේ බිත්තියක් සිදුරු කොට, එම සිදුරෙන් පලා යා යුතු ය" යන විශ්වාසයක් විය. රජගහ නුවර සිටුතුමාට හා සිටු දේවියට ද මෙම රෝගය වැළඳිණ. ඔවුහු ඔවුන්ගේ ජීවිතවලටත් වඩා, පුතුගේ ජීවිතය අගය කළ නිසා, පුතු සිටු මැදුරෙන් පිටතට යැවීමට තීරණය කළහ. මව්පියෝ පුතු කැඳවා, ඔවුන් සතු හතළිස් කෙළක් ධනය සඟවා ඇති ස්ථානය පෙන්වා දී කඳුළු පිරි නෙත්වලින් පුතු දෙස බලා, මෙසේ පැවසූහ.

"ආදරණීය පුතේ, අහිවාතක රෝගය වැළඳුණු හැම කෙනෙක් ම මිය යනවා. අප දෙදෙනාත් රෝගයෙන් මිය යනු ඒකාන්තයි. ඒ නිසා පුතා බිත්තියක් සිදුරු කොට, එම සිදුරෙන් පිට වී ගොස් ජීවිතය බේරා ගන්න. පුතාට කැමති දිනෙක අවුත් වස්තුව ලබා ගන්න."

මෙය ඇසූ සිටු පුත්‍රයා හඬා වැළපී, මව්පියන්ගෙන් සමු ගෙන, කඳුළු සලමින්, ඔවුන් කී පරිදි සිටු මැදුරෙන් පිටත් ව ගියේ ය.



නොබෝ දිනකින් මව්පියෝ 'අහිවාතක' රෝගයෙන් මිය පරලොව ගියහ. නිවසින් පිට වූ සිටු පුත්‍රයා, අවුරුදු දොළහකට පසු සිටු මැදුරට පැමිණියේ ය. මුහුණ පුරා වැවුණු රැවුලින් යුතු ව, දුගී වෙසින් පැමිණි ඔහු, කිසිවකුටත් හඳුනා ගත නො හැකි විය.

සිටු කුමරා මාපියන් කී පරිදි වස්තුව තිබෙන ස්ථානය වෙත ගියේ ය. එහෙත්, තමා දිළිඳු වෙසින් පැමිණි නිසා, එම වස්තුව ගැනීමට බිය විය. "නාඳුනන පුද්ගලයකු පැමිණ, සිටු මැඳුරේ වස්තුව ගෙන ගියේ ය"යි, සමාජයෙන් කිසියම් චෝදනාවක් එල්ල වේදෝ යි ඔහුට සැක සිතිණි. ඒ නිසා හෙතෙම වස්තුව නො ගෙන ආපසු ගියේ ය.

දුගී වෙසින් සිටි මෙම සිටු කුමරා, වීදියට ගියේ රැකියාවක් සොයා ගැනීම සඳහා ය. ඔහුට උදෑසන කැඟසා නුවර වැසියන් අවදි කරවා, අදාළ වැඩ කටයුතු සඳහා යොමු කරවීමේ රැකියාවක් ලැබිණි. එතැන් පටන් හෙතෙම අලුයම අවදි ව නුවර කර්මාන්ත කරන්නවුන්ට මහ හඬින් ඝෝෂා කරමින් විධාන දෙන්නට විය. මහ හඬින් කැඟසන නිසා ඔහු '**කුම්භඝෝෂක**' නමින් හඳුන්වන ලදී. හෙතෙම විවිධ කාර්යයන් කරන අයට කරුණාවෙන් අමතමින් ඔවුන් ඒ ඒ කාර්යයන් සඳහා යොමු කළේ ය. මෙහි දී කුම්භඝෝෂකයා පිරිමින්ට ගැල් හා සම්බන්ධ සියලු කටයුතු ද, කාන්තාවන්ට ඉවුම් පිහුම් ආදී කටයුතු ද ආදී වශයෙන් අදාළ කටයුතු කරන ලෙස සිහිපත් කළේ ය.

මෙසේ සෑම උදෑසනක ම ගැඹුරු හඬින් විධාන දෙන කුම්භඝෝෂකයාගේ කට හඬ බිම්සර රජුට ද ඇසිණි. රජතුමා කෙනකුගේ කටහඬ අසා අනාවැකි කීමට දන සිටි හෙයින්, එම කටහඬ දිළින්දකුගේ නො වන බව තේරුම් ගත්තේ ය. එතැන් පටන් විමසිලිමත් ව සූක්ෂම ව කුම්භඝෝෂක පිළිබඳ තොරතුරු සොයන්නට විය.

රජතුමා කුම්භඝෝෂක රජ වාසලට ගෙන්වා තොරතුරු විමසුවේ ය. තමා රජගහ නුවර සිටාණන්ගේ පුත්‍රයා බවත් කුඩා කල තම නිවසේ අයට 'අහිවාතක' නම් දරුණු රෝගයක් වැළඳුණු බැවින්, පියතුමාගේ උපදෙස් පරිදි තමා නිවසින් පලා ගොස් ආපසු පැමිණි බවත් කීවේ ය. තම පියාණන් වූ සිටුතුමා ධනය සඟවා තිබෙන තැන තමා දන්නා බවත් එම ධනය ගෙන සැපසේ ජීවිකාව ගෙන ගියේ නම්, "එක්වර ම ඒ සා විශාල ධනස්කන්ධයක් හිමි වූයේ කෙසේ දැයි සමාජයෙන් ප්‍රශ්න ඇති වේ ය" යන බිය නිසා ජීවත් වීම සඳහා මෙබඳු රැකියාවක් තෝරාගත් බවත් තවදුරටත් කුම්භඝෝෂක පැහැදිලි කළේ ය. රජතුමා, සතළිස් කෝටියක් ධනය ඇති මෙම අනතිමානී පුද්ගලයා ගැන පැහැදී ඔහු සතු වස්තුව රජවාසලට ගෙන්වා ගෙන සිටු තනතුර දී, තම දියණිය ද සරණ පාවා දුන්නේ ය. එතැන් පටන් ඔහු කුම්භඝෝෂක සිටුවරයා නමින් ප්‍රසිද්ධ විය. රජතුමා බුදුරජාණන් වහන්සේට ද ඔහු හඳුන්වා දී අගය කළේ ය.

මෙහි එන කුම්භඝෝෂක වැඩිහිටියන්ට කීකරු කෙනකු බව, මවුපියන් කී අවවාද අසා සිටු මැදුරෙන් පිටවීමෙන් පැහැදිලි වෙයි. තමා සතු වස්තුව වුවත්, නො ගත යුතු අවස්ථාවේ නො ගැනීමෙන් සැකයට ලක් නො වූයේ, ඔහුගේ ස්ථානෝචිත ප්‍රඥාව නිසා ය.

සිටු කුමරකුට නො ගැළපෙන රැකියාවක් සොයා ගැනීමෙන් දියුණු වීමට ඔහු තුළ තිබුණු උත්සාහය පැහැදිලි වෙයි. අලුයම පිබිදීමෙන් ඔහුගේ අප්‍රමාද බව හෙළි වේ. සේවක සේවිකාවන්ට වැඩ පැවරූ ආකාරයෙන් ඔහුගේ ක්‍රියාවන්ගේ පිරිසිදු බවත් නිවැරදි බවත් දැනගත හැකි ය. එසේ ම ඔහු මනා සිහියෙන් මෙම කාර්යයන් ඉටු කළ බව පෙනේ. වැඩ පැවරීමේ දී ඔහු කාරුණික වදන්වලින් අමතමින් සිත් නො තලා වැඩ පැවරුවේ ඔහුගේ සංයමය නිසා ය. ඔහු තම තත්ත්වයට නො ගැළපෙන රැකියාවක් වුවත් එය ධාර්මික ලෙස කර ඇති බව පෙනේ. කුම්භඝෝෂකගේ ජීවිතයේ සාර්ථකත්වයට උත්සාහය, මනා සිහිය, තම ක්‍රියාවන්ගේ පිරිසිදු හා නිවැරැදි බව, විමසා බලා කටයුතු කිරීම, සංයමය, ධාර්මික ව ජීවත් වීම හා අප්‍රමාදය උපයෝගී විය.

"උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිස්සම්මකාරිනෝ,
සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ - අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති."

(ධම්මපද-අප්පමාද වග්ග)

මෙම ගාථාව කුම්භඝෝෂක අරභයා දේශනා කරන ලදී.

| | | |
|---|---|---|
| උට්ඨානවතෝ | - | උට්ඨාන වීර්යයෙන් යුක්ත වූ |
| සතිමතෝ | - | සියලු ලොකු කුඩා කටයුත්තෙහි එළඹ සිටි සිහිය ඇති |
| සුචිකම්මස්ස | - | සිත, කය, වචනය යන තිදොරින් නිවැරැදි ව කටයුතු කරන |
| නිස්සම්මකාරිනෝ | - | විමසා බලා කටයුතු කරන |
| සඤ්ඤතස්ස | - | හික්මුණු |
| ධම්මජීවිනෝ | - | ධාර්මික ව ජීවත් වන |
| අප්පමත්තස්ස | - | අප්‍රමාද වූ තැනැත්තාගේ |
| යසෝ | - | කීර්තිය |
| අභිවඩ්ඪති | - | වැඩි දියුණු වේ. |

උට්ඨාන වීර්යයෙන් යුත්, ලොකු කුඩා කටයුත්තෙහි එළඹ සිටි සිහිය ඇති, සිත-කය-වචනය යන තිදොරින් නිවැරැදි ව කටයුතු කරන, විමසා බලන සුලු, හික්මුණු, ධාර්මික ව ජීවත් වන අප්‍රමාද වූ තැනැත්තාගේ කීර්තිය වැඩි දියුණු වේ.

**පුද්ගල දියුණුවට මහෝපකාරී වන කරුණු**

1. උත්සාහය
2. මනා සිහිය
3. තම ක්‍රියාවන්ගේ පිරිසිදු බව හා නිවැරැදි බව
4. විමසා බලා කටයුතු කිරීම
5. සංයමය
6. ධාර්මික ව ජීවත් වීම
7. අප්‍රමාද බව

උත්සාහය ඉගෙනුම ලබන කාටත් තිබිය යුතු ය. උත්සාහය නොමැති නම් ඉගෙනීම කළ නො හැකි ය. "තව ටික වේලාවකින් පාඩම් කරනවා. දැන් හවස් වෙලා, දැන් උදේ වැඩියි, දැන් බඩගිනියි, දැන් කෑම කෑ හැටියේ, දැන් සීතලයි, දැන් රස්නෙයි," කියමින් පාඩම් අතපසු කළොත්, එය ඉගෙනුමට බාධාවකි. සිටු මැදුරක සැප විඳිය හැකි කුම්භඝෝෂක අලුයම නැඟිට, වැඩ පවරමින්, දක්ෂ ලෙස තම රැකියාව කළේ උට්ඨාන වීර්යය නිසා බව පැහැදිලි ය.

මනා සිහිය ද පාසල් දරුවන්ගේ ඉගෙනුම සාර්ථක කර ගැනීමට අවශ්‍ය ය. ඔබට ගුරුතුමා, ගුරුතුමිය උගන්වන දේ හොඳින් සිහියෙහි, මතකයෙහි තබා ගැනීමත්, "අද අපට මේ මේ වැඩ කරන්න තියෙනවා, රැස්වීම් තියෙන්නේ අසවල් දවසේ, විභාගය අසවල් දවසේ," ආදී වශයෙන් මනා සිහියෙන් සිටීමත් ඉගෙනුම සාර්ථක කර ගැනීමට උපකාරී වේ.

පාසල් දරුවන් වචන පාලනය කර ගැනීම වටී. මේ දේ කිව යුතුයි, මේ දේ නො කිව යුතුයි, අසුවලාට මේ දේ කිව්වොත් හොඳයි, අසුවලාට මේ දේ කියන්න හොඳ නෑ, ආදී වශයෙන් තේරුම් ගෙන වචන පාලනය කර ගැනීමෙන් බොහෝ කරදර අඩු විය හැකි ය.

කුම්භඝෝෂක පිරිමින්ට එක් වැඩ කොටසකුත්, කාන්තාවන්ට වෙනත් සුදුසු වැඩ කොටසකුත්, කාරුණික ව පැවරීමෙන් ඔවුහු එම කාර්යයන් සාර්ථක ව ඉටු කළහ. විමසා බලා කටයුතු කිරීම නම් යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කිරීමයි. විමසා බලා කටයුතු කිරීමෙන් ඉගෙනුම හොඳින් කළ හැකි වෙයි. කුම්භඝෝෂක විසින් දුර දක්නා නුවණින් යුතුව කරන ලද සුළු රැකියාව වුවද සාර්ථක විය.

සංයමය පාසල් දරුවන් වන අපට ද අත්‍යවශ්‍ය ය. හික්මුණු ගතිය නොමැති නම් ඉගෙනීමෙන් පලක් නැත. ''සීලෙන අනුපෙතස්ස සුතෙනත්ථොන විජ්ජති'' කියා ඇත්තේ ද එබැවිනි.

ධාර්මික බව, ඉගෙනුම සාර්ථක ව කිරීමට උදවු වෙයි. ළමයින් වංචාව, සොරකම ආදියෙන් වැළකී සිටීමට පුරුදු විය යුතු ය. තමාගේ පොතක් පෑනක් වුවත් මිතුරකුට දුන් පසු එය ආපසු ගැනීමේ දී අවිශ්වාස නො කරන අන්දමින් එය ගැනීම සුදුසු ය. කුම්භඝෝෂක තම ධනය වුවත් සුදුසු වේලාව එනතුරු ගැනීමෙන් වැළකී සිටීමෙන් ඔහු අස්ථාන සැකයට ලක් නො වී ය.

පුද්ගලයාගේ දියුණුවට අප්‍රමාද බව ද ඉතා වැදගත් ය. පාසල් දරුවන් අප්‍රමාද ව කලට වේලාවට නින්දෙන් නැඟිට, අද කළ යුතු දේ අද ම කිරීමෙන් තම දියුණුව සැලසෙනු ඇත. කුම්භඝෝෂක ද අලුයම නැගිට මනා සංවිධානයෙන් කටයුතු කිරීම නිසා දියුණු විය.

මෙබඳු ගුණාංග පාසල් දරුවකුගේ ඉගෙනුම සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ය. ඉහත කී ගාථාවේ සඳහන් කරුණු හත පුද්ගල දියුණුව සඳහා වැදගත් ය. මෙබඳු ගුණාංගයන්ගෙන් යුතු වූ පුද්ගලයාගේ භෝග සම්පත් ද පරිවාර සම්පත් ද කීර්ති වර්ණනා නම් වූ යසස ද විශේෂයෙන් වැඩේ. ඒ නිසා අපි ද දියුණුව සඳහා මෙම ගාථාවේ සඳහන් කරුණු හත අපේ ජීවිතවලට සම්බන්ධ කරගෙන ජීවිත අභියෝග ජය ගනිමු.

## සාරාංශය

කුම්භඝෝෂක චරිතයෙහි, අප ජීවිත සාර්ථක කර ගැනීමට අවශ්‍ය ආදර්ශ රාශියක් ඇත.

- මවුපියන්ගේ අවවාද පිළිගැනීම
- තමාට හිමි දෙයක් වුවත්, නුසුදුසු වේලාවෙහි ගැනීමෙන් වැළකීම
- අස්ථාන සැකයට හේතුවන දේවල් කිරීමෙන් වැළකීම
- රැකියාවල උස් පහත්කම් ගැන නොසිතා, ලැබුණු රැකියාව තෘප්තිමත් ව කිරීම
- තමා කරන කවර කටයුත්තක් වුව ද උපරිම ශක්තියෙන් කිරීම
- සේවකයන්ගේ ශක්ති හඳුනාගෙන, ඔවුන්ට නිසි කාර්යයන් පැවරීම
- තමා ඇසුරු කරන අය සමඟ සුහද ව කටයුතු කිරීම
- අප්‍රතිහත ධෛර්යය ජීවිතය සාර්ථක කර ගැනීමට මහෝපකාරී වන බව

## ක්‍රියාකාරකම

1. පුද්ගලයාගේ දියුණුවට හේතු වන කරුණු හත ලියන්න.
2. පාසල් ශිෂ්‍යයකු වශයෙන් හොඳින් ඉගෙනීමට අවශ්‍ය වැදගත් කරුණු හතරක් ලියන්න.
3. 'උට්ඨානවතො' යන ගාථාව කට පාඩමින් කියන්න.

## පැවරුම

දියුණුවට අදාළ කරුණු ඇතුළත් වෙනත් ගාථා සොයා තේරුම සහිත ව කුඩා පොතක ලියන්න.